අංක 38 ඒ, බෙරගම පාර, අගලවත්ත පදිංචි මුත්තැලිප්පු නියාස්ගේ නිලුෂිකා ලක්මාලි (ජා. හැ. අ. 857813901 V) වන මම, මාගේ ඇටර්නි බලකරු වශයෙන් උඩුබද්දව, තැපැල්තල්ගහ පොත්ත පදිංචි ගිරාන පතිරන්නැහැලාගේ නිශාන්ත ප්‍රියදර්ශන පතිරණ (ජා. හැ. අ. 690812908 V) යන අය පත් කරමින් 2015.12.16 වැනි දින කුලියාපිටියේ දී අත්සන් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. කරුණාරත්න මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 239 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බල පත්‍රය මගින් කරනු ලබන කිසිදු කටයුත්තක් අද පටන් නීත්‍යානුකූල නොවන අතර, එමගින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් මාගේ වගකීමක් නොමැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

07-740

**2007 අංක 7 දරන සමාගමේ පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : එස්. එම්. සී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 123522
දිනය : 2017.06.30
ලියාපදිංචි අංකය : අංක 116 බී, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07
සමාගමේ ලේකම් : සී. මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම එස්. ඊ. සී/(2)2013/311

07-741

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ඔගැන්ලො බිස්නස් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 119110 | 2017.01.02 | අංක 25, ප්‍රතිබිම්බාරාම පාර, කළුබෝවිල, දෙහිවල. |

සමාගම් ලේකම්වරු.

07-627/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| යූ. ජේ. ඉන්වෙස්මන්ට් (පීවීටී) එල්ටීඩී | පී. වී. 121928 | 2017.04.27 | අංක 23, විහාර මාවත, රිව(ර්) සයිඩ්, මාවතුර |
| ඇෆ්රිකා ඒෂියා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 120150 | 2017.06.01 | අංක 11, බිම්බාරාම පාර, පිළියන්දල. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්.ටී.ඩී,
සමාගම් ලේකම්වරු.

07-641

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ස්කයිලාර්ක් ආර් එන් එල් ඒ (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 122839 | 2017.06.05 | අංක 147/1, වැලිතුඩුව, කරඩුවාවෙල, වැරැල්ලාගම. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී,
සමාගම් ලේකම්වරු.

07-642

# රටබීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

**2018 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශීය මත්පැන් රේන්දය විකිණීම**

2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විදේශ මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට පවත්වන කොන්දේසි මාලාවට යටත්ව විදේශ මත්පැන් තැබෑරුම සඳහා හොරණ ප්‍රාදේශීය ලේකම් තැන වන මා විසින් 2017.08.11 වැනි දින පෙ. ව. 10.00 දක්වා භාර ගනු ලැබේ.

**1. අංක 01. හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තැබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතුය. මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. විධිමත්ව සකස් කරන ලද ටෙන්ඩර්පත්‍ර කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ ''අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම ටෙන්ඩරය 2018'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. එසේ සකස් කළ ටෙන්ඩර්පත්‍ර සහිත කවර,

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2017.08.11 වැනි දින පෙ. ව. 10.00 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතුය. මෙම රේන්දය විකිණීම

2017.08.11 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩරය විකුණන දින නියමිත වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසිය යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට අවශ්‍ය ලියකියවිලි ද රැගෙන ආ යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතු ය.

06. 2018 වර්ෂයට දැනට තැබෑරුම පිහිටුවා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

මෙම දැන්වීම අනුව 2017.08.11 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2017.09.20 වැනි දින පෙ. ව. 10.00 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද, එසේම නැවත විකිණීම ද 2017.09.20 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. කමල් පුෂ්පකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2017 ජූලි මස 11 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම -2018*

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *පළාත් පාලන බල ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තබන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2017.08.11 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2017.08.11 වැනි දින පෙ. ව. 10.00 | 3,000 | 2017.09.20 වැනි දින පෙ. ව. 10.30 |

07-876

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී එෆ් සී සී බැංකුව -පීඑල්සී**

(ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1669, 1817, 2105, 2368 සහ 2737 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ, කණ්ඩලම ග්‍රාමයේ පිහිටි, වෙලන්ගොල්ලේහේන ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 2011 ඔක්තෝබර් මස 20 වැනි දිනැති අංක 577 දරන පිඹුරේ ලොට් අංක 1 ඒ ලෙස දක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 17 (හෙක්ටයාර 0.1442)

එහි පිහිටි ගස්වැල් වගාවන් සහ සියල්ල සහිතව සහ අඩි 16ක් මාර්ගය භාවිතා කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය සහිතව ඉහත කී අංක 577 දරන පිඹුර සහ 1996 පෙබරවාරි මස 29 දිනැති අංක Central/Dambulla/2355 දරන රාජ්‍ය ප්‍රදන අංක යටතේ රඳවා තබාගත් සහ සතුකරගත් දේපළ (ලියාපදිංචි අංක MA/PA/DA/ 2355/4900/96)

දඹුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්. නිලන්ති කුමාරි හීන්කෙන්ද විසින් සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 1669 දරන, 2012 ජූලි මස 31 වැනි දිනැති අංක 1817 දරන 2013 ජූලි මස 26 වැනි දිනැති අංක 2105 දරන 2014 ජුනි මස 17 වැනි දිනැති අංක 2368 දරන සහ 2015 අගෝස්තු මස 11 වැනි දිනැති අංක 2737 දරන උකස්කරයන් ප්‍රකාර, දඹුල්ල පදිංචි දිසානායක මුදියන්සේලාගේ වසන්ත කුමාර බණ්ඩාර විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 අගෝස්තු මස 10 වැනි දින (බ්‍රහස්පතින්ද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 110,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකතන අංක 011 - 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංකය : 081 - 2227593,
දුරකතන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකතන අංක : 011-2502680, 2585408,
දුරකතන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-549

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**

(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 39/1634/43 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාවට අයත්, ග්‍රෑන්ඩ්පාස් දකුණ, කොට්ඨාස අංක 14 පිහිටි, අංක

39, කෙත්තාරාම මාවත යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් මැතකදී සාදන ලද 2009 නොවැම්බර් 25 දින දිනැති අංක 485/2009 දරන පිඹුරේ ලොට් අංක 3A ලෙස දැක්වෙන (කලින් අංක 1850 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස පැවති ඉඩමේ) සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය අක්. 00 රූඩ්. 00 පර්. 4.92. එහි පිහිටි සියල්ල සහිතව.

පිළිවෙලින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජිනි බස්නායක, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇන් එස්. ගනේගොඩ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජිනි බස්නායක විසින් සහතික කරන ලද 2011 ජනවාරි මස 12 දිනැති, 2011 ජනවාරි මස 18 දිනැති සහ 2011 ජනවාරි මස 18 දිනැති අංක 38/1633/42 සහ 39/1643/43 දරන සංගාමී උකස්කරයන් ප්‍රකාර, කොළඹ 14 ඊට් මෝර් රෙස්ටෝරන්ට් නම් හවුල් ව්‍යාපාර පවත්වාගෙන යන කොළඹ 14 පදිංචි මොහොමඩ් සරුක් මොහොමඩ් ෆකුර්ඩීන් සහ ෆාතිමා රුසානා ෆකුර්ඩීන් හෙවත් ෆාතිමා රුසානා ආරිෆ් හෙවත් ෆලීල් ආරිෆ් පාතුමා රුෂානා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 අගෝස්තු මස 09 වැනි දින (බදාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10 % ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1 % ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 % ක් (සියයට දෙකහමාර),
4. රු. 73,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00

ගැනුම් මිලෙන් 90 % ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න:
දුරකථන අංක : 011-2371371.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-643

---

**ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. මහජන බැංකුව සහ සම්පත් බැංකුව පී. එල්. සී.**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධිත ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ ලංකා බැංකුව විසින් වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව විසින් විකිණීම පිළිබඳ දැන්වීම.

අංක 30, මාලිගාව පාර, රත්මලාන පිහිටි ට්‍රයිස්ටාර් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ණය වගකීම් වෙනුවෙන් 2 වන පටුමග, පිටත මාලිගාව පාර, නෙලුම්පුර රත්මලානා/අංක 88, මාලිගාව පාර, රත්මලානා/ 154 (183/184) ශ්‍රී රාහුල මාවත, කටුබැද්ද/කඳවල එස්ටේට්, අංක 29/5, කඳවලන මාවත, කඳවල, රත්මලානා/අංක 24, එගොඩහේන පාර, (බොරුපන) තෙලවල, මොරටුව පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017

පෙබරවාරි මස 03 දිනැති ගැසට් පත්‍රයේ හා 2017 ජනවාරි මස 20 දිනැති ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුව,

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත මගින් පවරා ඇති බලය යටතේ හැටන් නැෂනල් බැංකුව (පී. එල්. සී.) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 ඔක්තෝබර් මස 21 වැනි දිනැති සහ 2016 නොවැම්බර් මස 04 දිනැති ගැසට් පත්‍රයේ ද 2016 ඔක්තෝබර් මස 10 දිනැති ඩේලිමිරර් සහ 2016 නොවැම්බර් මස 08 දිනැති දිනපතා ලක්බිම සහ තිනක්කුරල් පුවත්පත්වල පළ වූ යෝජනා සම්මුතියකට ද,

එමෙන් ම 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29ඩී වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 පෙබරවාරි මස 17 දිනැති ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි මස 03 දිනැති ඩේලිනිවුස් සහ පිළිවෙලින් 2017 පෙබරවාරි මස 06 සහ 2017 පෙබරවාරි මස 07 දිනැති දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල පළ වූ මෙම යෝජනා සම්මුතිය මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පැවති රැස්වීමක දී ඒකමතිකව සම්මත කර ගත් යෝජනා සම්මුතිය ද,

එමෙන් ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 පෙබරවාරි මස 17 දිනැති ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි මස 03 දිනැති දිවයින, තිනක්කුරල් සහ ද අයිලන්ඩ් යන පුවත්පත්වල පළ කරන ලද සම්පත් බැංකුව (පී. එල්. සී.) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 අංක 01 සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීම පිළිබඳ පනතේ (විශේෂ විධිවිධාන) 04 වැනි වගන්තිය යටතේ සම්මත කරගත් යෝජනා සම්මතය ද, අනුව මුළු ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වැනි වගන්තිය යටතේ ද හැටන් නැෂනල් බැංකුව (පී. එල්. සී.) හි ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි අංක 13 වන වගන්තිය යටතේ ද මහජන බැංකුවේ මහජන බැංකු පනතේ 29 වන වගන්තිය යටතේ ද සම්පත් බැංකුව (පී. එල්. සී.) හි ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 13 වන වගන්තිය යටතේ ද, මෙහි පහත උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් මෙහි පහත සඳහන් කර ඇති දින සහ වේලාවන්හි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

## උපලේඛනය

### නිශ්චල දේපළ සහ වෙන්දේසි දින හා වේලාවන් පිළිබඳ විස්තරය

1. රත්මලාන, නෙලුම්පුර, මාලිගාව පාර, 2 වැනි පටුමගෙහි පිහිටි දේපළ එකී ස්ථානයේ දී ම 2017 අගෝස්තු මස 24 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ තෙලවල ග්‍රාමයේ නෙලුම්පුර පිටත මාලිගාව පාර, 2 වැනි පටුමගෙහි පිහිටි ලේඩි කැතරින් ගෘෆ් නමැති සහ එනමින් ප්‍රසිද්ධ ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඩී. ජී. එම්. පීටර් ප්‍රනාන්දු විසින් සාදන ලද 1983 සැප්තැම්බර් මස 10 දිනැති අංක 1316 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : මැටි කාණුව (අංක 4430 දරන පිඹුරෙහි ලොට් 4) ද, නැගෙනහිරට : 2 වැනි පටුමග (කලින් අංක 4430 දරන පිඹුරෙහි ලොට් 11) ද, දකුණට: ලොට් 2 ද, බස්නාහිරට : නෙලුම්පුර පාරේ වරිපනම් අංක 26, 46 සහ 44 (බලයලත් මිනින්දෝරු) එච්. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1962 ජූලි 31 දිනැති අංක 2838 දරන පිඹුරෙහි ලොට් 21 හි කොටස්) මායිම්ව එකී අංක 1316 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිහක (අ. 0 රූ. 0 පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2095/189 හි ලියාපදිංචි කර ඇත.

2. රත්මලාන පිටත මාලිගාව පාර අංක 88 හි පිහිටි දේපළ එකී ස්ථානයේදී ම 2017 අගෝස්තු 24 වැනි දින ප. ව. 1.00 ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ තෙලවල පිහිටි රත්මලාන මාලිගාව පාරේ දැනට වරිපනම් අංක 88 දරන ගොඩනැගිල්ල සහිත ලේඩි කැතරින් ගෘෆ් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1968 ජුනි 16 දිනැති අංක 4430 දරන පිඹුරෙහි ලොට් 22 ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 22 උතුරට : අංක 2833 දරන පිඹුරෙහි ලොට් 2 (පාර) ද, නැගෙනහිරට: එකී අංක 4430 දරන පිඹුරෙහි ලොට් 32 (පාරට

වෙන් කළ කොටස) ද, දකුණට : එකී අංක 4430 දරන පිඹුරෙහි ලොට් 23 ද, බස්නාහිරට : එකී අංක 4430 පිඹුරෙහි ලොට් 21 ද, මායිම්ව එකී අංක 4430 දරන පිඹුරට අනුව පර්චස් දහඅටක (අ. 0 රූ. 0 පර්. 18) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1514/281 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට පහත සඳහන් ඉඩම මතින් හා ඒ දිගට පාරේ අයිතිය ද ඇත.

එකී තෙලවල පිහිටි ලේඩි කැතරින් ගෘප් නමැති ඉඩමෙහි, බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1968 ජූනි 16 දිනැති අංක 4430 දරන පිඹුරෙහි ලොට් 32 ලෙස දක්වා ඇති (පාරට වෙන් කළ කොටස) එනම් එකී ලොට් 32 උතුරට : අංක 2833 දරන පිඹුරෙහි ලොට් 2 (පාර) ද, නැගෙනහිරට : එකී අංක 4430 දරන පිඹුරෙහි ලොට් 33 සිට 41 දක්වාද, දකුණට : එකී අංක 2833 දරන පිඹුරෙහි ලොට් 24 ද, බස්නාහිරට : එකී අංක 4430 දරන පිඹුරෙහි ලොට් 31 සහ 22 සිට 26 දක්වා ද, මායිම්ව එකී අංක 4430 දරන පිඹුරට අනුව පර්චස් තිස්නවයයි දශම හතරක (අ. 0 රූ. 0 පර්. 39.4) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 933/227 හි ලියාපදිංචි කර ඇත.

එකී තෙලවල පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1962 ජූලි 31 දිනැති අංක 2833 දරන එකී පිඹුරෙහි 2 (එස්ටේට් පාර) ලෙස දක්වා ඇති (ලේඩි කැතරින්) ගෘප් ලොට් ඒ හි බෙදූ කොටසක් වන) එකී ලොට් 2 උතුරට ඩියුමැක්ස් ලිමිටඩ් පරිශ්‍රය, සී/ස ජුපිටර් සිගරට් සහ දුම්කොළ සමාගම පරිශ්‍රය, ලොට් 1 සහ එම ඉඩමේ ම කොටසක් ද, නැගෙනහිරට : එම ඉඩමේ ම අංක 2833 දරන පිඹුරෙහි ලොට් 30 ද, දකුණට : එම ඉඩමේ ම අංක 2833 දරන පිඹුරෙහි ලොට් 1, 3, 7, 21, 22, 23, 26, 27, 28, 30 සහ 32 ද, බස්නාහිරට : කොළඹ ගාලුපාර ද මායිම් එකී අංක 2833 දරන පිඹුරට අනුව අක්කර හතරයි රූඩ් දෙකයි පර්චස් දහසයක (අ. 4 රූ. 2 පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1582/134 හි ලියාපදිංචි කර ඇත.

1. කටුබැද්ද, ශ්‍රී රාහුල මාවත, අංක 154, 183, 184 හි පිහිටි දේපළ එකී ස්ථානයේ දී ම 2017 අගෝස්තු මස 31 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ ඔප්පුවට අනුව මොරටුව, කටුබැද්ද,ශ්‍රී රාහුල මාවතේ, වරිපනම් අංක 184 දරන එහෙත් වඩා නිවැරදි ලෙස මොරටුව, කටුබැද්ද, ශ්‍රී රාහුල මාවතේ අංක 154 හි පිහිටි කාර්යාලය, කම්හල් ගොඩනැගිලි සහ වෙනත් ගොඩනැගිලි සහිතව බලයලත් මිනින්දෝරු ඩබ්. දන්තනාරායන විසින් සාදන ලද 1993 මාර්තු 4 දිනැති අංක 1244 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා නිරූපණය කර ඇති මොරටුව කුරුඳුවත්ත නමැති සහ එනමින් ප්‍රසිද්ධ බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : ශ්‍රී රාහුල මාවත සහ ඉඩම් ඉතිරි කොටස (බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා ගේ අංක 437 දරන පිඹුරෙහි ලොට් 1) ද, නැගෙනහිරට : ආරියවතී ප්‍රනාන්දුගේ සහ ජී. ඒ. ප්‍රනාන්දුගේ දේපළ ද දකුණට : ජී. ඒ. ප්‍රනාන්දුගේ දේපළ සහ කාණුව ද බස්නාහිරට : ජේ. ඊ. ප්‍රනාන්දුගේ සහ එඩ්වින් ප්‍රනාන්දුගේ දේපළ සහ ඉඩමේ ඉතිරි කොටස (බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වාගේ අංක 437 දරන පිඹුරෙහි ලොට් 1) ද, මායිම් ව එකී අංක 1244 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් තුනයි දශම එකයි තුනක (අ. 0 රූ. 3 පර්. 3. 13) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1908/18 හි ලියාපදිංචි කර ඇත.

2. රත්මලාන, කඳවල, කඳවල මාවත, අංක 29/5, කඳවල එස්ටේට් හි පිහිටි දේපළ එකී ස්ථානයේදී ම 2017 අගෝස්තු මස 31 වැනි දින ප. ව. 1.00 ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලෙපත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාවේ රත්මලාන කඳවල මාවතේ වරිපනම් අංක 29/5 දරන ගොඩනැගිල්ල සහිත කඳවල එස්ටේට් අංක 03 දරන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ෆර්ඩිනැන්ඩ්ස් විසින් සාදන ලද 1964 පෙබරවාරි මස 1 දිනැති අංක 865/1961 දරන පිඹුර මත 1961 අප්‍රේල් මස බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද ලොට් 13 හි උප බෙදීම් වන ලොට් 17, 18, 20, 21 සහ 22 ලෙස නිරූපිත ඒකාබද්ධ කරන ලද බිම් කොටස්වල නැවත මැනීමක් වන කඳවල එස්ටේට් නමැති සහ එනමින් ප්‍රසිද්ධ ඉඩමෙහි බලයලත් මිනින්දෝරු පී. සින්නම්බි විසින් සාදන ලද 1984 ජනවාරි 31 දිනැති අංක 3466 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඊසාන දිගට දනට කඳවල මාවතෙහි වරිපනම් අංක 29/16 ඒ දරන ලොට් 13 හි 19 සහ 23 ඉඩම් කැබලි ද ගිණිකොණට දනට ලොට් 13 හි 28 බිම් කැබැල්ල දන් පළමු වන හරස් පටුමග ද නිරිතට ලොට් 14 හි 4 ඉඩම් කැබැල්ල දන් අයිලන්ඩ් සී ෆුඩ් ලිමිටඩ් ද වයඹට දනට කඳවල මාවතෙහි වරිපනම් අංක 38/1 දරන ලොට් 13 හි 16 ඉඩම් කැබැල්ල ද සහ පාරට වෙන් කළ ලොට් 13 හි 27 ඉඩම් කැබැල්ල ද මායිම්ව අංක 3466 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකයි පර්චස් විස්සක (අ. 0 රූ. 2 පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි එම් 2031/34 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට පහත දැක්වෙන ඉඩම් මතින් සහ ඒ දිගට පාරේ අයිතිය ද ඇත.

2.1 එකී රත්මලාන දකුණ පිහිටි කඳවල එස්ටේට් අංක 3 හි කොටසක 1960 දෙසැම්බර් මස සහ 1961 ජනවාරි දිනැති එමෙන්ම බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ෆර්ඩිනැන්ඩස් විසින් සාදන ලද අංක 865/1961 දරන මැනුම් පිඹුරෙහි ලොට් 8 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කොළඹ ගාලු පාරේ සිට අත්තිඩිය දක්වා PWD පාර ලොට් 11, 12, 16 සහ 17 ද, නැගෙනහිරට සී වී හට් සහ සමාගම උරුමකම් කියන පරිශ්‍රය ලොට් 7, 10, 13 සහ 15 ද, දකුණට : ලොට් 13, 14 සහ 15 ද පරණ ගුවන් තොටුපල පාර ද බස්නාහිරට : ලොට් 4, 6, 9, 11, 12, 16 සහ 17 ද මායිම් ව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස්අටයි දශම අටයි තුනක (අ. 1 රූ. 3 පර්. 38.83) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1668/217 හි ලියාපදිංචි කර ඇත.

2.2 එකී රත්මලාන දකුණ පිහිටි කඳවල එස්ටේට් හි කොටසක 1960 දෙසැම්බර් සහ 1961 ජනවාරි දිනැති බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ෆර්ඩිනැන්ඩ්ස් විසින් සාදන ලද අංක 865/1965 දරන පිඹුරෙහි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද උප බෙදීමක් වන 26 ඉඩම් කැබැල්ල (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් ලොට් කරන ලද උප බෙදීමකට අනුව උතුරට : 13 හි උපබෙදීම් වන ඉඩම් කැබලි 1, 2, 3, 4, 5, 6 සහ 7 ද නැගෙනහිරට : ලොට් 13 හි උපබෙදීමක් වන 28 ඉඩම් කැබැල්ල (පාරට වෙන් කළ කොටස) ද දකුණට : ලොට් 13 හි උපබෙදීම් වන 8, 10, 11, 12, 13, 14 සහ 15 ඉඩම් කැබලි ද, බස්නාහිරට: ලොට් 8 (පාරට වෙන් කළ කොටස) ද මායිම් ව පර්චස් තිස් නවයයි දශම නවයයි දෙකක (අ. 0, රූ. 0, පර්. 39.92) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1754/62 හි ලියාපදිංචි කර ඇත.

2.3 එකී රත්මලාන දකුණ පිහිටි කඳවල එස්ටේට් හි කොටසක 1960 දෙසැම්බර් මස 1961 ජනවාරි දිනැති බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ෆර්ඩිනැන්ඩ්ස් විසින් සාදන ලද අංක 865/1965 දරන පිඹුරෙහි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද උප බෙදීමක් වන 27 ඉඩම් කැබැල්ල (පාරට වෙන් කළ කොටස) ලෙස නිරූපිත බිම් කොටස බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සිදු කරන ලද උප බෙදීමට අනුව උතුරට : ලොට් 13 හි උප බෙදීම් වන 10, 11 සහ 26 ඉඩම් කැබලි ද, නැගෙනහිරට : ලොට් 13 හි උප බෙදීම් වන 12 සහ 19 ඉඩම් කැබලි ද, දකුණට : ලොට් 13 හි උප බෙදීම් වන 18, 17 සහ 16 ඉඩම් කැබලි ද, බස්නාහිරට : ලොට් 13 හි උප බෙදීම් වන 11, 10 සහ 09 ඉඩම් කැබලි ද, මායිම් ව පර්චස් දහනවයයි දශම අටයි නවයක (අ. 0 රූ. 0 පර්. 19.89) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1668/123 හි ලියාපදිංචි කර ඇත.

2.4 එකී රත්මලාන දකුණ පිහිටි කඳවල එස්ටේට් හි කොටසක 1960 දෙසැම්බර් සහ 1961 ජනවාරි දිනැති බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ෆර්ඩිනැන්ඩ්ස් විසින් සාදන ලද අංක 865/1965 දරන පිඹුරෙහි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද උප බෙදීමක් වන 28 ඉඩම් කැබැල්ල (පාරට වෙන් කළ කොටස) ලෙස නිරූපිත බිම් කොටස බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් සිදු කරන ලද උප බෙදීමට අනුව උතුරට : ලොට් 13 හි උප බෙදීම් වන 20, 21, 22, 23, 24, 25 ඉඩම් කැබලි සහ රජයේ ඉඩම මෙන් ම රත්මලාන ගුවන් තොටුපල පරිශ්‍රය ද, නැගෙනහිරට : රජයේ ඉඩම සහ රත්මලාන ගුවන් තොටුපල පරිශ්‍රය ද, දකුණට : ලොට් 13 හි උප බෙදීම් වන 7, 15, 25 ඉඩම් කැබලි ද, බස්නාහිරට : ලොට් 13 උප බෙදීම් වන 20, 21, 22, 23, 24, 25 ද මායිම්ව රූඩ් එකයි පර්චස් විසිදෙකයි දශම දෙකයි දෙකක (අ. 0 රූ. 1 පර්. 22.22) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1525/249 හි ලියාපදිංචි කර ඇත.

3. මොරටුව තෙලවල, එගොඩහේන පාර, අංක 24 හි පිහිටි දේපළ එකී ස්ථානයේ දී ම 2017 අගෝස්තු මස 31 වැනි දින ප. ව. 3.00 ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ, පල්ලෙපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ තෙලවල එගොඩහේන පාර වරිපනම් අංක 24 දරන දඹුගස්මුල්ල කුඹුර, වැලි නැති පිට්ටනියෙ කුඹුර, මීගහකුඹුර, දෙනිය ග්‍රවුන්ඩ් සහ හයිග්‍රවුන්ඩ් නමැති සහ එනමින් ප්‍රසිද්ධ ඉඩමට එහි ඇති ගොඩනැගිලි ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1991 සැප්තැම්බර් මස 18 දිනැති අංක 3027 දරන පිඹුරෙහි විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එගොඩහේන පාර ද, නැගෙනහිරට : අඩි 20 පළල පාරට වෙන් කළ කොටස ද, දකුණට : එම ඉඩමේ ලොට් 7 ද, බස්නාහිරට : එම ඉඩමේ කොටසක් ද, මායිම්ව එකී අංක 3027 පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් හතක (අ. 0 රූ. 2 පර්. 07) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1988/71 හි ලියාපදිංචි කර ඇත.

නම් වශයෙන් ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී., මහජන බැංකුව සහ සම්පත් බැංකුව පී. එල්. සී. යන බැංකු සමූහය වෙනුවෙන්,

සම්බන්ධතා කළමනාකරු,
අයකර ගැනීම් - ආයතනික.

ලංකා බැංකුව,
අයකර ගැනීම්, ආයතනික ඒකකය,
ලංකා බැංකුව චතුරශ්‍රය, අංක 01,
ලංකා බැංකු මාවත,
කොළඹ 01.

07-763

---

## යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ ඉඩම නමැති ගමේ පිහිටි එම් ජේ සී ප්‍රනාන්දු මාවතේ වරිපනම් අංක 31 දරන මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඕ. ජේ. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 3985 සහ අංක 1999 පෙබරවාරි මස 16 වැනි දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 1 දරන බිම් කොටස

ප්‍රමාණය : (අ. 0 රූඩ් 1 පර්. 27.92) රූඩ් එකයි පර්චස් විසි හතයි දශම නවයයි දෙකක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් සමගය.

ඉහත කී ඉඩම නමැති ගමේ පිහිටි මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 529/1 සහ 1964 මාර්තු මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටස ප්‍රමාණය. මෙම දේපළ නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 770/103 යටතේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉරානි කරුණානායක විසින් සහතික කරන ලද අංක 298 සහ 2010.11.15 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 416 සහ 2011.08.09 වැනි දින දරන තථ්‍ය ද්විතියික උකස් බැඳුම්කරය සහ අංක 631 සහ 2013.01.23 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය මගින් ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය ඩියෝග් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම මින්මතු බන්ධනදැයින් වශයෙන් හැඳින්වෙන සහ මුතුතන්ත්‍රිගේ ජානක විරාජ් රන්මල් පීරිස් සහ රණසිංහ ලියනගේ වාසනා පීරිස් (මින්මතු ඇතැම් තැනක උකස්කරුවන් වශයෙන් හඳුන්වන අය, කොළඹ 03 ගාළු පාරේ අංක 64 හි පිහිටි යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්දනධායී විසින් පැහැර ඇති හෙයින්, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017 ක් වූ අගෝස්තු මස 08 වැනි දින පෙ. ව. 10.00 ට අදළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කොළඹ සිට ගාළු පාරේ මොරටුව - කුරුස හන්දිය දෙසට ගමන් කර එතැනින් වමට ඇති පරණ ගාළු පාරට හැරී තවත් මීටර 75 ක් පමණ ගමන් කොට වමට ඇති M J C ප්‍රනාන්දු මාවතට හැරී තවත් මීටර 600 ක් පමණ ගමන් කළ විට අදල දේපළ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලේ සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුලත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න - නීති දෙපාර්තමේන්තුව, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී, අංක 64, ගාළු පාර, කොළඹ 03.
දුරකතන අංක : 011 2374100

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු - කොළඹ වාණිජ
මහාධිකරණ සහ දිසා අධිකරණ බලයලත්
වෙන්දේසිකරුවෝ, රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12.
දුරකතන අංක : 0112445393 - 0773242954.

07-716

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - තලවතුගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ 522 D පිටකෝට්ටේ ග්‍රාම නිළධාරී වසමේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සල්පිටි කෝර්ළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ පිටකෝට්ටේ හි පිහිටි පිටකෝට්ටේ සුහසාධක මාවතේ වරිපනම් අංක 38/7 දරන අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු R. T. අබේසිංහ විසින් 2009 නොවැම්බර් මස 01 දින සාදන ලද අංක 1701 දරන පිඹුරේ ලොට් 1 දරන ප්‍රමාණය පර්චස් විසිතුනයි දශම පහ (අ:0 රූ:0 පර්:23.5) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමඟ වේ.

පහත විස්තර සඳහන් මාර්ග වෙන්කිරීම මතුපිටින් මඟදිගේ හා ඒ තුළ ගමන් කිරීමේ ඇති අයිතිය ද සමඟ වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු G. L. B. නානායක්කාර විසින් 1986 අප්‍රේල් 08 දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1E (අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) ප්‍රමාණය පර්චස් තුනයි දශම හතයි බිංදුවයි (අ:0 රූ:0 පර්:3.70)

විජේසිංහගේ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆොන්සේකා සහ බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න ණයකරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 14 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.11.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද, බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.07.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2017.07.25 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම* .- බොරැල්ල නගර මධ්‍යයේ සිට කොටා පාර ඔස්සේ ශ්‍රී ජයවර්ධනපුර මාවතට පැමිණ කි.මී. 3.75 පමණ දුර ප්‍රමාණයක් ගමන්කර (බත්තරමුල්ල නගර මධ්‍යයට කිලෝමීටරයකට පමණ පෙර) දකුණට හැරී කෝට්ටේ පාරේ මීටර් 100 ක් පමණ දුරක් ගමන් කළ විට ඇතුල් කෝට්ටේ හංදිය හමුවේ. නරවත E. W. පෙරේරා මාවතේ (තවද කෝට්ටේ පාර ලෙස හඳුන්වන) කි.මී. 1.5 ක් පමණ දුරක් ගමන් කර (පිටකෝට්ටේ හංදියට කි.මී. 3/4 පමණ පෙර) වමට හැරී බැද්දගාන පාරේ මීටර් 200 ක් පමණ දුරක් ගමන්කර නැවත දකුණට හැරී (ෆුට් බෝල් සංගමයට විරුද්ධ පැත්තේ) අඩි 10-12 පළල සුහසාධක මාවතේ මීටර් 150 ක් පමණ දුර ප්‍රමාණයක් ගමන්කර අවසාන වශයෙන් වමට ඇති අඩි 10 ක් පළල කොන්ක්‍රීට් අතුරා ඇති ගමන් මාර්ගයේ මීටර් 25ක් පමණ ගියවිට අදළ දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. අදළ දේපළ හඳුනා ගැනීම සඳහා අංක 38/7 සුහසාධක මාවත, බැද්දගාන, පිටකෝට්ටේ.

*ගෙවීමේ ක්‍රමය* .- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2000/- (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/- (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ තලවතුගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන්, පී. එල්. සී,
අංක 7, සුරම්‍ය ගොඩනැගිල්ල,
කෝට්ටේ පාර, තලවතුගොඩ.
දුරකථන අංක 011- 2773551/01-2773452
ෆැක්ස් අංකය : 011-2773553.

07-657

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මොරටුව මහනගර සභා සීමාව තුළ, ලක්ෂපතිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලක්ෂපතියේ පිහිටි, අඟුලාන දුම්රියපල පාරේ, පළමු පටුමග, වරිපනම් අංක. 24 දරන කුට්ටේරියවල එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මානක ජේ.ඒ. ඩබ්ලිව්. කාර්වල්හෝ විසින් මැන සාදන ලද වර්ෂ 2005/04/08 දිනැති අංක 5504 දරන පිඹුර ප්‍රකාරව (බලයලත් මානක ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද වර්ෂ 1967/02/15 දිනැති අංක 1243 දරන පිඹුරේ බෙද වෙන් කර ඇති ලොට් 20 නැවත මැනීමකි.) බෙද වෙන් කරන ලද ලොට් 20 දරන ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමග වේ.

බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 20
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 16 වන දින පෙ.ව. 10.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට ගාලු පාරේ අඟුලාන හන්දිය දක්වා ගොස් දකුණු පැත්තට හැරී අඟුලාන දුම්රියපල පාරේ මීටර් 650 ක් පමණ යන්න. ඉන්පසුව පළමු පටුමගෙන් වමට හැරී මීටර් 125 ක් පමණ ගිය පසු පිහිටා ඇති චීන අවන්හල පසුකළ පසුව දකුණු අත පැත්තේ විෂයගත දේපල පිහිටා ඇත.

නිව් ග්ලොබල් පොලිමර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයී ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී. නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.08.12 දිනැති අංක. 1128 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2017.07.06 දිනැති ඩෙයිලි නිවුස්, ලක්බිම, තිනක්කුරල් පුවත්පත් සහ වර්ෂ 2017.07.07 දිනැති ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහය),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 1,500 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු කළමනාකරු - ණය අයකරගැනීම් අංශය, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී, ප්‍රධාන කාර්යාලය, අංක. 450, ගාලු පාර, කෙළඹ 03.

දුරකතන අංක : 011-4667412/ 011-4667237/ 011-4667229.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940

07-702

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ, දසියා පත්තුවේ

මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොරස මැද 111/1 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මාබෝද්දල උප කාර්යාලය තුළ මාරපොල, දොරණාගොඩ බලබෝව ගම්වල පිහිටා ඇති උඩුගම්පොල, නයිවල වරිපනම් අංක 470 සහ 472 දරන ''ඉඳිගොල්ල හෙවත් සිල්වා තැන්න වත්ත''යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක ඒ. පී. වික්‍රමසිංහ විසින් සකසන ලද 2004.02.11 දිනැති අංක 2536 දරන පිඹුරෙහි ලොට් 1 වශයෙන් යනුවෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඒ මත ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත පිහිටි අනෙකුත් සියල්ල ද සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු ඒ 437/66 හි ලියාපදිංචි කර ඇත.

බිම් ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 34

වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 10.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය.* - ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ දක්වා දිවෙන පාරේ පිහිටි උඩුගම්පල නගරයෙන් නයිවල පාරේ සැතපුම් 2ක් පමණ ගිය පසු කොරස හන්දිය පසුකර යාර 400ක් පමණ ගිය පසු ඇති පොදු පාසල පසුකළ සැනින් වම් පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

පාවුළුගේ සුනිමල් යන අය බන්ධනදයි/උකස්කරු ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.01.10 දිනැති අංක 184 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - වර්ෂ 2017.07.06 දිනැති ඩෙයිලි නිවුස්, ලක්බිම, තිනක්කුරල් පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 1,500 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමනාකරු - ණය අයකරගැනීම් අංශය, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී, ප්‍රධාන කාර්යාලය, අංක. 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667412/ 0114667237/ 0114667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ,
මහනුවර.
දුරකථන/ෆැක්ස් අංකය : 081- 2210595
ජංගම දුරකථන : 071- 4755974, 071- 4962449.

07-701

---

## සෙලාන් බැංකුව පී.එල්.සී - මාලඹේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල මාලඹේ පිහිටි ට්‍රාන්ස් වෝටර් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදයී වශයෙන් සෙලාන් බැංකුව පී.එල්.සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ අංක 520 ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු එම්.එල්.එන්. පෙරේරා විසින් සාදන ලද 2009 ජුනි 23 දිනැති අංක 5257 දරන සැලැස්මේ නිරූපණය වන කොස්වත්ත පාර, 1 වන පටුමග, වරිපනම් අංක 25/2 දරන නාවල කුරුඳුවත්ත නැමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ ලොට් ඒ 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 5257 දරන සැලැස්ම අනුව පර්චස් විසි නවයයි දශම හයයි තුනක් (අ.0, රූ.0, පර්.29.63) ක් (හෙක්ටයාර් 0.0149) විශාල ඉඩම.

පහත සඳහන් පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. අභංගම විසින් සාදන ලද කොළඹ දිසා අධිකරණයේ අංක 13718 පී නඩු වාර්තාවේ ගොනු කර ඇති 1977.09.18 දිනැති අංක 2135 සැලැස්මේ නිරූපණය වන නාවල කුරුඳුවත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ (අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2135 දරන සැලැස්මට අනුව පර්චස් පහක් (අ.0 රූ.0 පර්.5) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 අගෝස්තු මස 11 වැනි දින පෙරවරු 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- නාවල, කොස්වත්ත මංසන්ධියේ සිට කොස්වත්ත පාර ඔස්සේ මීටර් 100 ක පමණ දුරක් ගිය විට පිහිටි වංගුව අසලින් ඇති 1 වන පටුමගට හැරී තවත් මීටර් 150 ක පමණ දුරක් ගිය විට එම 1 වන පටුමගෙහි දිගුවක් සේ වම්පසට දිවෙන මාර්ගයේ තවත් මීටර් 30 ක පමණ දුරක් ගිය විට වරිපනම් අංක 25/2 දරන අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*.- *රජයේ ගැසට් පත්‍රයේ* 2016.11.11 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලි මිරර් පුවත්පත්වල 2016.11.11. වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2016.11.10 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු හා සෝෂක වේතන රු. 500, 6. සියළුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පී.එල්.සී. වෙත ගෙවා නිමකළ යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.* : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පී.එල්.සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456478, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න,
(සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 0112572940

07-698

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ජාඇල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ජාඇල පදිංචි මනම්පේරි මහපටබැඳි රාලලාගේ හිරන්ත සුරේන් කුරේ වනිගරත්න සහ ක්‍රිස්තෝගු බදුගේ උදනි හිරන්තරා සඳුනි යන අය බන්ධනදයින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාව තුළ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 191 කණුවන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කණුවන පිහිටි බලයලත් මිනින්දෝරු එම්.ඩී.එඩ්වඩ් විසින් සාදන ලද 2014.08.02 දිනැති අංක 6620 දරන සැලැස්මේ නිරූපණය වන පීටර් රුද්‍රිගු මාවත වරිපනම් අංක 48/08 ඒ දරන කයිතන්පුල්ලේගේවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල පර්චස් විස්සක් (අ.0 රූ.0 පර්.20) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

පහත විස්තර කරනු ලබන ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ.

පෙර කී කණුවන පිහිටි බලයලත් මිනින්දෝරු කේ.ඊ.ජේ.බී. පෙරේරා විසින් සාදන ලද 1997.08.28 වැනි දිනැති අංක 5136 දරන සැලැස්මේ නිරූපණය වන කයිතන්පුල්ලේගේවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල පර්චස් හතරයි දශම අටයි බිංදුවක් (අ.0 රූ.0 පර්.4.80) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 අගෝස්තු මස 15 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* ජා ඇල සිට පැරණි මීගමුව මාර්ගය ඔස්සේ මීටර් 500 ක පමණ දුරක් ගොස් දකුණුපසට ඇති මිනුවන්ගොඩ සහ ගම්පහ දෙසට දිවෙන මාර්ගයට හැරී තවත් මීටර් 150 ක් පමණ දුරක් ඉදිරියට ගිය විට දකුණුපසට ඇති පීටර් රොඩ්රිගෝ මාවතට හැරෙන්න. (තක්ෂිලා ෆාස්ට් ෆුඩ්ස් වෙළඳසල ඉදිරිපිට ඇති) එම පීටර් රොඩ්රිගෝ මාවත ඔස්සේ තවත් මීටර් 150 ක පමණ දුරක් ගිය විට අංක 48/8A දරන අදාළ දේපළ මාර්ගය අවසන් වීමට මීටර් කිහිපයකට පෙර මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ* 2017.06.02 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලි මිරර් පුවත්පත්වල 2017.06.14 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2017.06.02 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000/-, 5. ලිපිකරු හා සෝෂක වේතන රු. 500/-, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුව-හොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.* : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පී.එල්.සී., අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456478, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න
(සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකතන අංක : 011 3068185, 011-2572940.

07-699

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.